**විසර්ජන ශීර්ෂ - 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිළිඳුකම අඩු කිරීමේ මූල පිරීම්, බෙදා හැරීම සහ කළමනාකරණය

(ආ) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය

(ඇ) සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කිරීම සහ පාලනය කිරීම

(ඈ) මැතිවරණ සම්බන්ධීකරණය

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මෙහෙයවීම.

(ඊ) ආදායම් එකතු කිරීම.

(උ) කොට්ඨාශ මට්ටමේ සහ ගම් මට්ටමේ නිලධාරින් හා සංවිධාන මඟින් රජයේ කටයුතු සමායෝජනය කිරීම හා නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම

(ඌ) වෙනත් අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(එ) පළාත් සභා කාර්යයන්ට සහායවීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) නැගෙනහිර නුවරගම් පළාත

(ආ) මධ්‍යම නුවරගම් පළාත

(ඇ) තලාව

(ඈ) ගලෙන්බිඳුනුවැව

(ඉ) මහවිලච්චිය

(ඊ) රඹෑව

(උ) මිහින්තලේ

(ඌ) පලාගල

(එ) නොච්චියාගම

(ඒ) ඉපලෝගම

(ඔ) ගල්නෑව

(ඕ) මැදවච්චිය

(ක) පදවිය

(ග) පලුගස්වැව

(ජ) හොරොව්පතාන

(ට) කැබිතිගොල්ලෑව

(ඩ) කැකිරාව

(ණ) කහටගස්දිගිලිය

(ත) තඹුත්තේගම

(ද) ශ්‍රාවස්තිපුර

(න) තිරප්පනේ

(ප) රාජාංගනය

1.3 විගණන විෂය පථය

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 04 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට ( ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 211 |

### (ආ) විසර්ජන ගිණුම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,137,122,834 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.1,114,466,967 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.23,055,867 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.03 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන | 470,975,000 | 599,822,834 | 3,784,880 | 0.63 |
| මූලධන | 61,100,000 | 537,700,000 | 19,270,987 | 3.58 |
| එකතුව | 532,075,000 | 1,137,522,834 | 23,055,867 | 2.03 |

**(i) අයවැය විචලනය**

- වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.25,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.1,914,534 වූ අතර, එය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ත් සියයට 58 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 17 කින් හා දෙපාර්තමේන්තු 13 කින් පිළිවෙලින් රු.3,510,917,854 ක් හා රු.1,386,918,092 ක් වශයෙන් එකතුව රු.4,897,835,947 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු.3,291,366,793 ක් හා රු.1,259,379,517 ක් වශයෙන් රු.4,550,746,309 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරිය රු.347,089,638 ක් හෙවත් ලැබී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.09 ක් විය. ඉහත ප්‍රතිපාදන අතර වූ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙන් හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 100 ක්ද, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණ ප්‍රතිපාදන වලින් පිළිවෙලින් සියයට 57 ක්, 67 ක් හා 96 ක් ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 27401 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 60,000,000 | 46,558,642 | 40,000,000 | 62,660,296 | 215,000,000 | 159,045,708 |

විෂය අංක 27401 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31 දින සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු.3,876,243 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමෙහි රු.255,872 ක් වූ හර ශේෂය 2013 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණි. එම ශේෂයෙන් රු.210,872 ක් 2008 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

------------------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.259,509,929 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.10,636,845 ක් වූ තැන්පතු 27 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, වාරි කළමනාකරණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් ගෙවා තිබූ රු.651,225 ක් වූ අත්තිකාරම්වලින් රු.184,800 ක තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 69 සිට දින 231 ක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම පිළියෙල කර විගණනය වෙත 2013 මාර්තු 06 දින ඉදිරිපත් කර තිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 1.6.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් වාහන 05 ක් වසර 05 ක කාලයක් තිස්සේ නිෂ්ක්‍රියව පැවතුණි.

(ii) ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ බෙදාහැරීම සඳහා මිලදී ගෙන තිබුණු රු.58,800 ක් වටිනා විවිධ භාණ්ඩ වසර දෙකක කාලයක් අදාළ ආයතන හෝ පුද්ගලයන් වෙත බෙදා නොහැර නිෂ්කාර්යව ගබඩා තුළ රඳවා තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැඟිල්ලක් 2009 වර්ෂයේ සිට පළාත් පශු වෛද්‍ය හා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත සහ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නිල නිවාස 2 ක් 2010 වර්ෂයේ සිට සර්වෝදය ආයතනය සහ සිවිල් ආරක්ෂක බලකාය වෙත විධිමත් අනුමැතියකින් තොරව මුදාහැර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.1,300,445 ක් වූ අතර, ඒවා වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවත එමින් තිබුණි. මීට අමතරව විසර්ජන ගිණුම සමඟ තොරතුරු ඉදිරිපත් නොකළ රු.352,578 ක බැරකම් ද විය.

(ii) වැය විෂයයන් 4 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු.1,120,826 ක බැරකම්වලට එළඹ තිබුණි.

**1.8 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණ වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i). | ව්‍යවස්ථාපිත විධිවිධාන<br>2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය | 2,775,000 | රාජාංගනය හා ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අයත් ඉඩම්වල කළුගල් කැඩීම මත 2010 වර්ෂයේ සිට 2012 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා කාලය වෙනුවෙන් අය කළ යුතු රජයේ ගාස්තු අයකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-------------------------------- | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.1.1 වගන්තිය | | මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 2 ක, තඹුත්තේගම, පලාගල, හොරොව්පොතාන හා මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන 01 බැගින් හා නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 02 ක ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>-------------------------- | | |
| | මුදල් රෙගුලාසි 494(2) ප්‍රකාරව සහ 2013 ජනවාරි 17 දිනැති අංක පීඑෆ්/ආර්ඊඩී/ Stamp/2012 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය | | ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මුද්දර මාර්ගයෙන් එකතු කරන ලද ආදායම් බෙදී යාම පිළිබඳ වාර්තාවක් නියමිත ආකෘති ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | වෙනත් චක්‍රලේඛ<br>---------------------- | | |
| | 2011 ජුනි 14 දිනැති අංක විවැ/ චක්‍රලේඛ/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | 1,384,759 | මැදවච්චිය, රඹෑව, නොච්චියාගම, කැබිතිගොල්ලෑව, රාජාංගනය, මිහින්තලය සහ කැකිරාව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොගෙවූ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව නියමිත මාසයට පසු මාසයේදී තවදුරටත් ඒ පිළිබඳව විශ්‍රාමිකයා විමසීම් නොකරන්නේ නම් එම මුදල් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ |

| | |
|---|---|
| | ජනරාල්වරයා නමින් චෙක්පතක් ලියා ප්‍රධාන ගණකාධිකාරි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත්, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සැලකිය යුතු කාල පමාවක් සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ මුදල් ප්‍රේෂණය කර තිබුණි. |
| 2007 ඔක්තෝබර් 05 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වරයාගේ ලිපිය. | ග්‍රාම නිලධාරින් විසින් විශ්‍රාමිකයන් හා වැන්දඹු හා අනත්දරු ප්‍රතිලාභීන්ගේ නාමලේඛනය භාවිතයට ගෙන මිය ගිය පුද්ගලයන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දිය යුතු වුවද, එසේ ලබානොදීම නිසා මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මියගිය විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් වශයෙන් රු.175,684 ක් ගෙවා තිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳ විගණන නියැදි පරික්ෂණ වලදී අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළ මුළු ඇස්තමේන්තු පිරිවැය එකතුව රු.5,720,434 ක් වු ව්‍යාපෘති 11 ක් 2012 වර්ෂය තුළදී ආරම්භ නොකර ඇත්හැර දමා තිබුණි.

(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාල ව්‍යාපෘති 08 ක් සඳහා රු.6,859,333 ක ප්‍රතිපාදන සලසා එයින් රු.3,093,630 ක් වියදම් කර තිබුණද, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබීම හේතුවෙන් රු.3,093,630 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) සැලකිය යුතු කාල පමවාක් සහිත ව්‍යාපෘති

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව ස්ථිර වහලක් නොමැති අයට උළු ලබාදීම සඳහා 2011/2012 වර්ෂවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තුලාන 13 ක නිවාස 406 කට උළු ලබාදී තිබුණද, ඉන් නිවාස 75 ක් පමණ 2013 දෙසැම්බර් 31 දින වන විටත් උළු සෙවිලි කර නොතිබුණි.

1.10 කාර්ය සාධනය

2012 වාර්ෂික ඇස්තමේන්තු වලට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

(i) ආදායම් එකතු නොකිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් මඟින් 2012 දෙසැම්බර් 31 දිනට එකතු කරගත යුතු ඉඩම් බදු ආදායම්, වාහන බලපත්‍ර ආදායම් සහ කළු ගල් කැනීම මත අය කරන රජයේ ගාස්තු පිළිවෙලින් රු.5,515,602 ක්, රු.50,375,463 ක් හා රු.3,299,370 ක් අයකර ගෙන නොතිබුණි.

(ii) ගිනි අවි බලපත්‍ර ලබා නොගැනීම

1996 අංක 22 දරන තුවක්කු ආඥා පනතේ 22 වගන්තියේ 3 උපවගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ නිකුත් කර තිබුණු මුළු ගිනි අවි බලපත්‍ර ප්‍රමාණය 1700 ක් විය. 1988 සිට 2012 දක්වා කාලයට අදාළව නිකුත් කර තිබුණු ගිනිඅවි 269 ක බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම

බලපත්‍ර අළුත් නොකිරීම පිළිබඳ විධිමත් විමසීමක් කර, එම බලපත්‍ර අවලංගු කිරීමට හෝ හිඟ ආදායම වූ රු.69,900 ක් දඩ මුදල් ද සමඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන

2009 පෙබරවාරි 13 දිනැති අංක 2008/1 දරන ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව වයස මාස 24 ත් මාස 60 ත් අතර වයස් කාණ්ඩයේ දරුවන් සඳහා කිරි වීදුරුවක් ලබාදීමේ වැඩ සටහන පිළිබඳව විගණනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ලියාපදිංචි පෙර පාසල් 384 කින් පෙර පාසල් 225 ක පමණක් ක්‍රියාත්මක කර තිබුණි. පෙර පාසල් 159 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ලබාදුන් ණය මුදල් අය කිරීම

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 ක් අයකර ගැනීමේ කොන්දේසිය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23 ක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ණය වශයෙන් රු.127,040,321 ක් ලබාදී තිබුණි. එම ණය මුදලින් 2013 ඔක්තෝබර් 01 දින වන විටත් රු.33,550,022 ක් හිඟ හිට තිබුණි. ණය මුදල් ලබාදී මාස 06 ක් තුළ එම ණය මුදල් පියවා ගත යුතු වුවත්, 2007 වර්ෂයේ සිට 2013 ඔක්තෝබර් 01 දින දක්වා ආපසු අයකර ගත යුතු ණය මුදලින් සියයට 26 ක් තවදුරටත් අයකර ගැනීමට තිබීමෙන් හිඟ ණය අයකර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බව නිරික්ෂණය විය.

1.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---

අක්‍රීය බැංකු ගිණුම්

---

2012 වර්ෂයේ ඔයාමඩුව දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතු සඳහා විවිධ ආයතන වලින් ලද රු.42,638,583 ක් බැංකු ජංගම ගිණුමෙහි තැන්පත් කර තිබුණත්, 2013 අගෝස්තු මාසය වන විටත් එම මුදල් නිශ්ක්‍රීයව පැවතුණි.

1.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ වෙරළ වැලි ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් විසින් වැලි කියුබ් 300 ක් සැපයීම වෙනුවෙන් රු.3,449,600 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ සඳහා වැලි කියුබ් එකක් රු.11,200 බැගින් මුහුදු වැලි කියුබ් 198 ක් සැපයීම වෙනුවෙන් රු.2,217,600 ක් ගෙවා තිබුණි. 2013 සැප්තැම්බර් 22 දින සිදු කළ භෞතික පරීක්ෂණයේදී ක්‍රීඩාංගන භූමියට වැලි කියුබ් 86 ක් පමණක් සපයා තිබුණු බව අනාවරණය විය. ඒ අනුව සමාගම වෙත වැලි කියුබ් 112 ක් සඳහා රු.1,254,400 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශනය සැලසුම් කිරීමේදී එහි ඉදිකරන ප්‍රදර්ශන ගොඩනැඟිලි 2011 නොවැම්බර් 29 දිනැති අංක එම්එෆ්5/7/Dayata/K/2012 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය ප්‍රකාර ස්ථිර ගොඩනැඟිලි විය යුතු අතර එම ගොඩනැඟිලි රජයේ ආයතන වල ප්‍රයෝජනය සඳහා යොදා ගත යුතු බවට නියම කර තිබුණද, 2013 සැප්තැම්බර් 23 දින වන විටත් ප්‍රදර්ශන කුටි 03 ක් සහ සත්ව ගාල් ලෙස භාවිතා කිරීමට ඉදිකර තිබූ ගොඩනැඟිලි 08 ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ඉදිකළ ගොඩනැඟිල්ලක් කඩා වැටීමට ආසන්න තත්ත්වයක පැවතීම නිසා එය ප්‍රතිසංස්කරණය කර තිබුණ නමුත්, ගොඩනැඟිල්ල ඉතා අවදානම් තත්ත්වයක පැවතුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු ඊට යාබද කුඩා ගොඩනැඟිල්ලක පවත්වාගෙන ගියද කාර්යාල කටයුතු පවත්වාගෙන යා

හැකි පහසුකම් සහිත ඔයාමඩුව ප්‍රදර්ශන භූමියේ පිහිටි නිෂ්ක්‍රියව පවතින සුදුසු ගොඩනැගිල්ලක් වෙත ගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය යටතේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කරඹගොල්ලෑව ගමේ පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාගෙන 2012 දෙසැම්බර් 04 දින වන විට රු.757,047 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. භෞතික විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි අදාල කුඹුරු අස්වැද්දීම අවසන් කර තිබූ නමුත් ගොවීන් වෙත එම කුඹුරු නිත්‍යානුකූලව ලබාදී නොතිබූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඉ) නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි පහමුණේ සිට ගාලදිවුල්වැව පාරේ වැසි ජලය බැස්සවීම සඳහා කාණුවක් ඉදිකිරීමට රු.1,000,000 ක් එක ගමකට එක වැඩක් ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් අඩි 70 ක් පමණ දිගින් යුත් කාණුවක් කොන්ක්‍රීට් කිරීමට අමතරව ප්‍රයෝජනවත් වැඩ කොටසක් ඉටුවී නොතිබුණු අතර, ඒ සඳහා රු.979,177 ක් වැයකර තිබුණි. වැඩ ප්‍රමාණ පත්‍රයේ අංක 05 ප්‍රකාර රු.376,300 ක් වැය කර ජලය බැස යාම සඳහා කාණු කපා පස් ඉවත් කිරීමට මෙන්ම වැඩ ප්‍රමාණ පත්‍රයේ අංක 07 ප්‍රකාර රු.60,400 ක් වැය කර ඇතත් අනුමත පස් කපා ප්‍රවාහනය කර පිරවීමද සිදුකර නොතිබුණි.

(ඊ) මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් සිවලාපිටිය ගම්වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා "ප්ලෑන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය " මගින් ග්‍රාමීය ජනතාවගේ ශ්‍රම දායකත්වය ඇතිව වතුර ටැංකියක් හා ළිඳක් ඉදිකර තිබුණි. එම වතුර ටැංකියට වතුර පොම්ප කිරීම සඳහා ගමට ලැබෙන විදුලිය ප්‍රමාණවත් නොවන බැවින්, එය ක්‍රියාත්මක කළ නොහැකිව තිබියදී විදුලි සම්බන්ධතාවය යථාවත් නොකර එක ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය යටතේ ජල ටැංකිය හා ළිඳ වටා වැටක් ඉදිකිරීමට වැය කළ රු.829,021 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(උ) කැකිරාව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් නාවක්කුලම ගමේ ඉදිවෙමින් පැවතුණු ජල ටැංකිය සඳහා රු.1,000,000 ක් වියදම් කර තිබූ අතර, ඉතිරි වැඩ නිම කිරීම සඳහා එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය යටතේ රු.973,378 ක් වැය කර තිබුණත්, එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ජල ටැංකියේ ජල ටැංකිය සඳහා යොදා ගෙන තිබූ යකඩ දිරාපත්වී තිබූ බැවින්, ව්‍යාපෘතිය අතහැර දැමීමට සිදුවන

තත්ත්වයක් උද්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබූ රු.1,973,378 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

1.13 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයිති අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් පාලනය විය යුතු නිල නිවාස 14 ක උතුරු මැද පළාත් සභාවට අයත් නිලධාරීන් පදිංචිව සිටින අතර, එම නිවාසවල කුලී අයවීම හා නියමිත කාලය අවසානයේ ඒවා අපාසු භාරදීම විධිමත්ව සිදුවී නොතිබුණි. මෙම නිවාස පිළිබඳ විධිමත් දත්තද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර නොතිබුණි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් මෙම දේපල විධිමත් ලෙස පාලනය කිරීම හෝ වරිපනම් ගෙවීම, නඩත්තුව, පැවරීම හා කුලී අයවීම පිළිබඳ නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම යටතේ වී මිලදී ගැනීම සඳහා 2001, 2004/2005 හා 2005/2006 වර්ෂ වලදී ගෙවා තිබුණු රු.399,870,050 ක අත්තිකාරම් මුදලින් තවදුරටත් අයවිය යුතුව තිබූ රු.78,274,586 ක ශේෂය කපාහැරීම සඳහා 2011 ජුනි 21 දිනැති රජයේ ගිණුම්කාරක සභාව විසින් දී තිබූ නියෝගය 2012 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම රජයේ මෙහෙයුම් කටයුතු සිදුකර රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අයත් රාජ්‍ය ආයතන 27 ක් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල තුළ පිහිටා තිබුණද, මෙම රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වූ අභ්‍යන්තර දුරකථන පද්ධතියක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව නොතිබුණු බැවින්, මෙම රාජ්‍ය ආයතන සම්බන්ධිකරණය කිරීමේදී ගැටළු සහගත තත්ත්වයක් පැවතුණි.

(ඈ) කිකිළි පැටවු බෙදාදීම - පශු සම්පත් හා ධීවර අමාත්‍යාංශය

2012 ජුනි 07 වන දින මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රතිලාභීන් සඳහා කිකිළි පැටවුන් 975 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.399,750 ක මුදල් පළාත් අධ්‍යක්ෂ,

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ( උතුරු මැද පළාත ) වෙත ගෙවා තිබුණද, අදාළ කිකිළි පැටවුන්ගෙන් 760 ක් පමණක් මුදල් ගෙවා මාස 3 ½ කට පසුව එනම්, 2012 අගෝස්තු 29 වන දින ලැබී තිබුණි.

1.14 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 72 | 52 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 45 | 16 | 29 |
| (iii) | ද්විතියික මට්ටම | 1,347 | 1,090 | 257 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 255 | 196 | 59 |
| | එකතුව | 1,719 | 1,354 | 365 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 365 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.